**ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය - 2014**
-----------------------------------------------------------------------------------------

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1996 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතන පනතේ 25 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස නියෝජිතායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් නියෝජිතායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2 මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 ට අනුව කවර ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් භාවිතා කළද වාර්තා කරන දිනයේ සිට මාස 12 කට පෙර හා මාස 12 කට පසු අයකරගැනීමට බලාපොරොත්තුවන වත්කම් ද්‍රවශීලතාවය අනුව මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම හෙළිදරව් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ට අනුව වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු සිදුකර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මේ සඳහා අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම්වල වටිනාකම ප්‍රත්‍යාගණන අගයට වඩා රු.2,820,421,436 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ඉවත්කරන ලද වටිනාකම රු.80,000 ක් වූ වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයෙන් අඩුකර රඳවාගත් ලැබීම්වලට එකතු කර තිබුණි.

(ආ) දෝෂ සහගත ලෙස ගණනය කිරීම හේතුකොටගෙන ක්ෂය වෙන්කිරීමේ ගිණුමේ ගිණුම් විෂයයන් හතරක ශේෂය රු.6,883,045 ක් වැඩියෙන් හා ගිණුම් විෂයයන් තුනක ශේෂය රු.1,928,826 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී නිමකර ප්‍රයෝජනවත් තත්ත්වයට පත්කර තිබූ රු.152,245,007 ක් වටිනා ගොඩනැගිලි පිරිවැය තවදුරටත් කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී භාණ්ඩාගාරය විසින් ප්‍රදානයක් ලෙස රු.9,390,000 ක් වටිනා මෝටර් රථයක් ලබාදී තිබුණද සම්පූර්ණ ගණුදෙනුව ගිණුම්වලින් අත්හැරී තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1996 අංක 32 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනත | පනතේ සඳහන් අරමුණුවලින් බැහැරව මත්ස්‍ය වෙළඳසැලක් ඉදිකිරීම සඳහා රු.152,245,007 ක් වැය කර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදයේ 9.6 වගන්තිය | උණුසුම් ඇඳුම් මිලදීගැනීම සඳහා නිළධාරීන් තිදෙනෙකු වෙත සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබූ රු.49,390 ක අත්තිකාරම් මුදලින් උණුසුම් ඇඳුම් මිලදී ගත් බවට සනාථ කිරීම සඳහා බිල්පත් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 110 | පාඩු හා හානි සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා ගෙනගොස් නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 371 | අදාල කාර්යය නිමකළ විගස ලබා ගත් අත්තිකාරම් නිරවුල් කළ යුතු වුවද, අවස්ථා 88 ක දී නිලධාරීන් වෙත ලබා දී තිබූ රු.6,142,200 ක් වූ අත්තිකාරම් නිරවුල් කිරීමට මාස දෙකකට වැඩි කාලයක් ගතකර තිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 757(2) | සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2015 අගෝස්තු 23 දක්වාම විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | නියෝජිතායතනය සතු රු.1,211,097,184, ක් වටිනා ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතු වුවද, වටිනාකම රු.12,653,617 ක් වූ පරිගණක සම්බන්ධව ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | 1997 පෙබරවාරි 03 දිනැති අංක 06/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානයන්ට පටහැනිව නියෝජිතායතනය විසින් නිළධාරීන් 10 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය තුළදී වැඩ බැලීමේ දීමනා ලෙස රු.528,326 ක් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (උ) | 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානයන්ට පටහැනිව හා ගිවිසුමකින් තොරව 2013 අප්‍රේල් 01 දින සිට මාසිකව රු.50,000 ක දීමනාවක් ගෙවීම මත උපදේශකවරයෙක් බඳවාගෙන සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් දක්වා රු.950,000 ක දීමනාවක් ගෙවා තිබුණි.තවද මෙම උපදේශක විසින් කරන ලද උපදේශන සේවා සම්බන්ධ වාර්තාද නියෝජිතායතනයට ලබා දී නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ තුල නියෝජිතායතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.117,261,228 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.120,061,820 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,800,592 ක වර්ධනයක් පෙන්නුම් කළ අතර වෙනත් ආදායම් වැඩිවීම හා නඩත්තු කටයුතු සඳහා දරන ලද වියදම් අඩුවීම මීට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ගිණුම් විෂයයන් 08 ක වියදම් සියයට 12 සිට සියයට 87 ක් දක්වා වැඩිවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක නියෝජිතායතනයේ පර්යේෂණ හා සංවර්ධන වියදම් වෙනුවෙන් ලද ප්‍රදාන හා එමගින් දරා ඇති වියදම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා ලැබූ මුළු ප්‍රදානවල අඩුවීම රු. මිලියන 67ක් වී තිබුණු අතර ඒ වෙනුවෙන් දරා ඇති මුළු වියදමේ වර්ධනය රු.මිලියන 02 ක් වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේදී පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා ලැබී තිබුණු මුළු ප්‍රදාන ඉක්මවා රු.මිලියන 04 ක් දරා තිබුණි.

(ආ) වාර්ෂිකව ලැබෙන ප්‍රදාන අරමුණුගත කාර්යයන් සඳහා නොයෙදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 තුල නියෝජිතායතනය වෙත පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා වෙන්කළ මුදල රු.මිලියන 1,004 ක් වුවද, උපයෝජනය රු.මිලියන 277 ක් විය. ඒ අනුව ලද ප්‍රදානවලින් උපයෝජනය සියයට 28 ක් වී තිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

වර්ෂ තුනකට වඩා වැඩි කාලයක සිට භාවිතයෙන් ඉවත් කරන ලද වටිනාකම රු.220,560 ක් වූ යතුරුපැදි 08 ක්, වටිනාකම රු.1,990,280 ක් වූ ඩබල් කැබ් රථ 02 ක් හා වටිනාකම රු.1,520,400 ක් වූ වෑන් රථ 02 ක් අපහරණය කිරීමට තීරණය කර තිබුණද 2015 මැයි 20 දින වන විටත් අපහරණය කර නොතිබුණි.

### 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පෞද්ගලික අංශය විසින් සංවර්ධනය කරනු ලබන රාජ්‍ය ධීවර වරායයන් 06 කට අදාළ ශක්‍යතා අධ්‍යයන වාර්තා පිළියෙල කිරීම වෙනුවෙන් පෞද්ගලික අංශය විසින් රු.2,500,000 ක් නියෝජිතායතනයට ගෙවා තිබුණු අතර මේ සඳහා නියෝජිතායතනය විසින් රු.4,112,898 ක් වැය කර

තිබුණි. නියෝජිතායතනය විසින් වැඩියෙන් වැයකර ඇති රු.1,612,898 ක මුදල අයකර ගැනීමකින් තොරව ශක්‍යතා අධ්‍යයන වාර්තාව පෞද්ගලික අංශය වෙත නිකුත් කර තිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේදී රු.15,685,682 ක් වැයකර ඉදිකර තිබුණු පර්යේෂණ යාත්‍රාව නියමිත තාක්ෂණයෙන් යුක්තව සකස් නොකිරීම හේතුවෙන් පර්යේෂණ කටයුතු සඳහා විගණිත දිනය දක්වාම යොදාගෙන නොතිබුණි.

(ආ) ක්ෂුද්‍ර ජීවී පර්යේෂණ කටයුතු සඳහා 2013 වර්ෂයේදී රු.7,086,700 ක් වැයකර මිලදී ගන්නා ලද මොබයිල් 3D ස්කැනර් යන්ත්‍රය විගණිත දින වන විටත් පර්යේෂණ කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි.

(ඇ) 2009 වර්ෂයේදී පරිගණක මෘදුකාංගයක් මිලදී ගැනීම සඳහා රු.272,160 ක් වැයකර තිබූ නමුත් එම මෘදුකාංගය 2015 අගෝස්තු 30 දින දක්වාම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඈ) භෝජන ශාලාවක් ඉදිකිරීම සඳහා 2011 වර්ෂය තුළ රු.2,626,384 ක් වැයකර තිබූ නමුත් මෙම භෝජන ශාලාව සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඉ) නිසි ඇගැයීමකින් තොරව මිලදීගෙන තිබූ වටිනාකම රු.4,493,052 ක් වූ (HP 200) බෝට්ටු එන්ජින් දෙකක් වසර තුනකට වැඩි කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**4.5 හඳුනාගත් පාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කුලියාපිටිය වයඹ විශ්වවිද්‍යාල භූමියෙහි පවත්වන ලද දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා නියෝජිතායතනය විසින් 2014 වර්ෂයේදී මිලදීගෙන තිබූ රු.978,715 ක් වූ භාණ්ඩ නැවත භාවිතා කිරීමකින් තොරව අනාරක්ෂිත ලෙස ගොඩ ගසා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සේවක භාරකාර අරමුදලට දායක මුදල් නියමිත දිනට නොගෙවීම නිසා රු.31,372 ක අධිභාරයක් ගෙවා තිබුණි.

**4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් නියෝජිතායතනයේ සම්පත්**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට අනුව තම ආයතනයට අයත් සම්පත් අදාල අමාත්‍යාංශයේ හෝ වෙනත් රජයේ ආයතනවලට යොදා ගැනීමට හා වියදම් දැරීමට අවසර නොමැති වුවද, 2014 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සේවක සංඛ්‍යාව 169 ක් ව පැවතියදී නියෝජිතායතනය සතු මානව සම්පත් රේඛීය අමාත්‍යාංශයට හා වෙනත් රජයේ ආයතනවලට මුදාහැර ඒ වෙනුවෙන් වැටුප් හා දීමනා වශයෙන් රු.1,027,742 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු අතර නියෝජිතායතනය විසින් අමාත්‍යාංශයේ වාහන වෙනුවෙන් රු.158,998 ක ඉන්ධන නිකුත් කර තිබුණි.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

සමාලෝචිත වර්ෂය අවසාන දිනට නියෝජිතායතනයේ අනුමත කාර්ය මණ්ඩලය 499 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 343 ක් වීමෙන් පුරප්පාඩු 156 ක් වූ අතර කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති අනියම් සේවක සංඛ්‍යාව 11 කි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන්වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවද, නියෝජිතායතනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ 2015 ජූලි 23 දිනදීය.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර විචලනයේ ප්‍රතිශතය සියයට 10 සිට සියයට 146 දක්වා වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**5.3 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම**

අපහරණය කළයුතු භාණ්ඩ හඳුනාගෙන එම භාණ්ඩ ඉතා ඉක්මනින් අපහරණය කිරීමට කටයුතු නොකර අනාරක්ෂිතව භූමියෙහි තැන්තැන්වල ගොඩගසා තිබීම හේතුවෙන් ඒ තුළ වැසි ජලය එක්රැස්වීම හේතුකොටගෙන මදුරු කීටයන් බෝවීමට ඉඩ සැලැස්වීම නිසා අධිකරණය විසින් නියෝජිතායතනයට දඩ මුදල් ද නියම කර තිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර නියෝජිතායතනයේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) අයවැය පාලනය
(ආ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) අත්තිකාරම් ගෙවීම
(ඈ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය
(ඉ) කාර්ය මණ්ඩල පරිපාලනය